රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/97 (I)

මගේ අංකය :-III/ 0266/2/68(එල්ප්)VI (5)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1998 මාර්තු මස 24 දින

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ණය මුදල් සඳහා පොලිය අය කිරීම**
**ආයතන සංග්‍රහය - XXIV පරිච්ඡේදය**

ණය වර්ග හයක් සඳහා අය කරන පොලී අනුපාතය 4.2% දක්වා අඩු කිරීම සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3:8 වගන්තිය සංශෝධනය කරමින් 97.11.19 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/67 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. රට තුල ඇතිවන කලබල නිසා නිශ්චල දේපල වලට හානි සිදුවන සහ /හෝ චංචල දේපල අහිමි වන රජයේ නිලධාරීන්ට වැටුප් අත්තිකාරම් ගෙවීමට විධිවිධාන සලසමින් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයට 14 වන වගන්තියක් අලුතින් එකතු කරමින් 1988.08.30 දිනැතිව නිකුත් කරන ලද රා.පරි.ච.ලේ. 29/88 අනුව අය කල යුතු පොලිය 7.2% වශයෙන් නියම කරනු ලැබ ඇත. ඉහත 1 වන ඡේදයේ සඳහන් ණය වර්ග හයට අමතරව 29/88 චක්‍රලේඛය යටතේ නිකුත් කරනු ලබන අත්තිකාරම් මුදල් සඳහා ද 1997.12.01 දින සිට අය කල යුතු වාර්ෂික පොලී අනුපාතය 4.2% බැගින් විය යුතු බවට දැන් රජය තීරණය කර ඇත.

03. දැනටමත් ලබා ගෙන ඇති ඉහත අත්තිකාරම් මුදල්වල 1997.12.01 දිනට ඉතිරිව ඇති ශේෂය සඳහා ද මෙම නව පොලී අනුපාතය බලපැවැත්වේ.

04. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිවය.

ඇ.කලේ/(ඩික්සන් නිලවීර)
වැඩ බලන ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය